සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனதுஇல / My No: DDD/HO/MF/05/C.S./2016

ඔබේ අංකය / உமது இல / Your No: ......................................

දිනය / திகதி / Date: **2016.12.30**

සියළුම දිවිනැගුම ප්‍රජාමූල බැංකු / බැංකු සමිති කළමනාකරුවන්,

## අනිවාර්ය ඉතිරිකිරීම් ආයෝජන අරමුදල් සඳහා පොලී ලබාදීම - 2016

දිවිනැගුම ප්‍රජාමූල බැංකු විසින් ප්‍රජාමූල බැංකු අංශයට එවන ලද අනිවාර්ය ඉතිරිකිරීම් ආයෝජන අරමුදල් වලට පොලී ගෙවීම සඳහා දිවිනැගුම ප්‍රජාමූල බැංකු අංශය 8% ක පොලී අනුපාතිකයක් ගණනය කර දිවිනැගුම ප්‍රජාමූල බැංකු වෙත නිකුත් කර ඇති අතර එයින් 7% ක පොලියක් ප්‍රතිලාභීන්ගේ ගිණුම් වලට බැර කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත.

දිවිනැගුම ප්‍රජාමූල බැංකු විසින් දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති මඟින් රාජ්‍ය බැංකු වල ආයෝජනය කර ඇති අනිවාර්ය ඉතිරිකිරීම් අරමුදල් (2012 අප්‍රේල් සිට 2016 මැයි දක්වා) සඳහා පොලී ගෙවීම සම්බන්ධව දිවිනැගුම ප්‍රජාමූල බැංකු කළමනාකරුවන් දිගින් දගටම කරන ලද ඉල්ලීම් සලකා බලා එම පොලී අනුපාත සංශෝධනය කිරීමට තීරණය කර ඇත.

ඒ අනුව 2016/11/30 දින නිකුත් කරන ලද දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශ පිලියෙල කිරීම යන හිසින් යුතු දි.ප්‍ර.බැ. 2016/09 චක්‍රලේඛයෙහි 5 වන වගන්තියේ 5.2 ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ඇත.

එහි දී 2016 වර්ෂය සඳහා පුද්ගලික අනිවාර්ය ඉතිරිකිරීම් තැන්පතු ගිණුම් සඳහා වාර්ෂික පොලිය 7% ක් වෙනුවට 6% ක් ලෙස සලකා කටයුතු කල යුතුය.

එසේපොලී ප්‍රතිශතය සංශෝධනය කිරීමේදී දිවිනැගුම ප්‍රජාමූල බැංකු මේවන විට ගිණුම් පියවීමේ කටයුතු සම්බන්ධව පහත සඳහන් පරිදි ගිණුම් තැබීම සිදු කල යුතුය.

01. 2016 වර්ෂයේ අනිවාර්ය ඉතිරිකිරීම් සඳහා පොලී බැර කිරීම් මේ වන විට අවසන් කර නොමැති නම් ඉහත සංශෝධනය ප්‍රකාරව පොලී අනුපාතය 6% ක් ලෙස සලකා පොලී බැර කර ගිණුම් පියවීම සිදු කල යුතුය.

| අධ්‍යක්ෂ ජනරාල් | අතිරේක අධ්‍යක්ෂජනරාල් | අධ්‍යක්ෂ (පාලන) | ප්‍රධාන ගණකාධිකාරී | කාර්යාලය |
|---|---|---|---|---|
| பணிப்பாளர் தலைமையதிபதி | மேலதிகபணிப்பாளர்தலைமையதிபதி | பணிப்பாளர்(நிர்வாகம்) | பிரதான கணக்காளர் | அலுவலகம் |
| Director General | Additional DirectorGeneral | Director (Administration) | Chief Accountant | Office |
| Tel:011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2869742 | 011-2887280 |
| Fax -011-2887280 | 011-2871672 | 011-2873996 | 011-2869742 | **011- 2887722(Hotline)** |
| dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | finance@divineguma.gov.lk | **Prabhu-desktop - Nimeshi** |

02. මේ වන විට 2016 වර්ෂයේ අනිවාර්ය ඉතිරිකිරීම් සඳහා 7% ක පොලී මුදල බැර කර අවසන් වී ඇත්නම්,සංශෝධනය අනුව 6%ක් පොලී ගලපා ඉතිරි 1%ක් වූ වෙනස පමණක් ගැලපීම කල යුතුයි. ඒ සඳහා පහත සඳහන් ගිණුම් සටහන් තැබිය යුතුය.

**a. දැනට පොලී තැන්පත් ගිණුම් හිමියන්ගේ ගිණුම් වලට බැර කර ඇත්නම්,**

| | | |
|---|---|---|
| කේත අංක 4408 - අනිවාර්ය ඉතිරිකිරීම් තැන්පත් ගිණුම | - | හර |
| (ඒ ඒ පුද්ගලික ගිණුම් හර කල යුතුය.) | | |
| කේත අංක 2008 - වැය ගිණුම - ගෙවූ පොලී අනිවාර්ය ඉතිරි | - | බැර |

**b. 2016.12.31 දිනට අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා පොලී වෙන් කර ඇත්නම්,**

| | | |
|---|---|---|
| කේත අංක 4108 - ගෙවීමට ඇති පොලී වෙන්කිරීම් ගිණුම් - අනිවාර්ය ඉතිරි | - | හර |
| කේත අංක 2008 - වැය ගිණුම ගෙවූ පොලී අනිවාර්ය ඉතිරිකිරීම් | - | බැර |

**කේ.කේ.එල්.චන්ද්‍රතිලක,**

**අධ්‍යක්ෂ (ක්ෂුද්‍රමූල්‍ය).**

**අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට**